## සීතාවක ප්‍රාදේශීය සභාව
## කොළඹ දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 29 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති සීතාවක ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

ගිණුම් වල දක්නට තිබූ ගිණුම් දෝෂ, ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් වශයෙන් අවස්ථා හා අගයයන් යටතේ පහත වගුවෙහි දැක්වේ.

| | ගිණුම් වලට බලපෑම | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් | | වියදම් | | වත්කම් | | වගකීම් | |
| | අවස්ථා ගණන | අගය | අවස්ථා ගණන | අගය | අවස්ථා ගණන | අගය | අවස්ථා ගණන | අගය |
| | | රු. ’000 | | රු. ’000 | | රු. ’000 | | රු. ’000 |
| (අ)ගිණුම්වල වැඩියෙන් දැක්වීම | 02 | 944 | - | - | 01 | 10,415 | 03 | 12,561 |
| (ආ)ගිණුම්වල අඩුවෙන් දැක්වීම | 01 | 247 | - | - | - | - | 02 | 12,917 |
| (ඇ)ගිණුම්වලින් අත්හැරීම් | - | - | 01 | 124 | 01 | 92 | 01 | 489 |

#### 1.3.2 නොසැසඳෙන පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 44,803,540 ක් වූ අතර, උපයෝගී ලේඛණ / වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 55,312,563 ක් විය.

**1.3.3 නිරවුල් නොකරන ලද ගිණුම්**

------------------------------

ගිණුම් විෂයන් 06කට අදාලව එකතු වටිනාකම රු. 2,225,018 ක් වූ ගිණුම් ශේෂ දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් තිබෙන අතර ඉකුත් වර්ෂ වල මාගේ වාර්තා වලින් මේ පිළිබඳව පෙන්වා දී තිබනද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

----------------------------------------

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

-------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 457,989 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 අනුකූල නොවීම්**

-----------------

පහත සඳහන් නීත, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණයන්ට අනුකූල නොවීම් පිළිබඳව විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 396(ඈ) | "A" දරන බැංකු ගිණුමේ රු.17.434 ක් වටිනා නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 570, 571 හා 572 | වසර 02 ඉක්මවු රු. 13,266,118 ක තැන්පත් ආපසු ගෙවිය යුතු තැන්පත වශයෙන් උපලේඛණවල දක්වා තිබුණි. මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉකුත් තැන්පත් පිළිබඳ ලැයිස්තු සකස් කර ඒවා සභාවේ ආදායමට එකතු කිරීමට හෝ ආපසු ගෙවීමට කටයුතු කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 715 (ඉ) | භාණ්ඩ ලැබීම්, නිකුත් කිරීම් පිළිබඳ ලියකියවිල, සනාථ වන වාර්තා හා ගිණුම් පවත්වා ගෙන නොතිබණි. |

තොග ලේඛණ යාවත්කාලීන කර නොතිබුණු බැවින් භෞතික තොග ශේෂ වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට හැකියාව නොලැබුණි.

(iv) මුදල් රෙගුලාසි 751(4)

භාණ්ඩ ලැබීම් නිකුත් කිරීම හා සම්බන්ධ ලියවිලි අංක අනුපිළිවෙලින් ගොනු කර තබා නොතිබුණි.

(v) මුදල් රෙගුලාසි 752

ගබඩාව තුල රාක්ක පත්‍ර ක්‍රමය ක්‍රියාත්මක නොවූ අතර තොග සටහන්, තොග කාඩ්පත්, බඩුලේඛණ යනාදිය සමග සසදා පහසුවෙන් හා ක්ෂණිකව හරි වැරදි බැලිය හැකි වන පරිදි භාරයේ තිබෙන භාණ්ඩ ක්‍රමානුකූලව පිළියෙල කර නොතිබුණි.

**(ආ) 2009 අප්‍රේල් 02 දිනැති අංක CM/WP/E4/14.5 දරන බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ ලිපිය**

කසල කළමනාකරණ ගිවිසුමකට එළඹීමට පෙර ඒ සම්බන්ධ වාර්තාවක් බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,684,184 ක් වූ අතර,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,243,083 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආඅායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 8,610 | 8,926 | 6,328 | 5,765 | 4,840 | 4,875 |
| (ii) | බදු කුලී | 12,876 | 11,059 | 2,733 | 11,282 | 9,785 | 2,585 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,495 | 1,425 | 22 | 1,382 | 1,533 | 21 |
| (iv) | වෙනත් ආදායම් | 70,748 | 60,601 | 24,734 | 60,840 | 70,581 | 3,022 |

ඉදිරිපත් කර ඇති සංඛ්‍යා ගිණුම් සමග නොසැසඳෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 2.2.2 හිඟ ආදායම්

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) **හිඟ කඩ කුලී**

2010 දෙසැම්බර් 31 දිනට රු. 1,249,095 ක කඩකුලී මුදලක් ලැබිය යුතුව තිබුණි.

(ii) **උසාවි දඩ මුදල්**

2010 වර්ෂය සඳහා රු. 10,000,000 ක උසාවි දඩ මුදලක් සභාවට ලැබිය යුතුව තිබුණි.

(iii) **මුද්දර ගාස්තු**

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයාගෙන් රු. 10,000,000 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.2.3 කඩ කුලී

(i) බදු ගිවිසුමේ අංක 27 කොන්දේසිය අනුව, බදු ගැණුම්කරු විසින් අදාළ දේපළ සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ වෙනත් අයෙකුට විකිණීම හෝ අතුරු බදු දීම

නොකළ යුතු වුව ද, කඩ කාමර 13 ක බදු ගැණුම්කරුවන් විසින් කුලී මුදල් අයකර ගනිමින් බාහිර පාර්ශවයන් වෙත අතුරු බදු දී තිබුණි.

(ii) වෙළදසැල් 43 ක 2010 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.548,956 ක් වූ මාස 03 ක් ඉක්මවූ හිඟ කඩ කුලිය සභාව විසින් අය කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර කුලි ගිවිසුමෙහි අංක 03 කොන්දේසි අනුව වෙළඳ අයිතිය අහිමි කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) වර්ෂ 02 කට වඩා වැඩි කාලයක් තිස්සේ වසා දමා ඇති හංවැල්ල නව වෙළඳ සංකීර්ණයේ අංක 49 දරණ කඩ කාමරය සම්බන්ධයෙන් සභාව විසින් බදුකරු සමග එළඹ තිබුණු කුලී ගිවිසමේ අංක 16 දරණ කොන්දේසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 41,405 | 40,382 | 1,023 | 42,338 | 39,087 | 3,251 |
| අනෙකුත් | 34,721 | 32,537 | 2,184 | 37,010 | 32,921 | 4,089 |
| උප එකතුව | 76,126 | 72,919 | 3,207 | 79,348 | 72,008 | 7,340 |
| ප්‍රාග්ධන වියදම | 27,935 | 53,401 | (25,466) | 47,575 | 90,911 | (43,336) |
| මුළු එකතුව | 104,061 | 126,320 | (22,259) | 126,923 | 162,919 | (35,996) |

## 2.4 අය වැය පාලනය

අයවැයගත ආදායම්/වියදම් හා තථ්‍ය ආදායම්/ වියදම් අතර සැලකිය යුතු අවාසි සහගත විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොමැතිබව විගණනයේදී නිරීක්ෂණය විය.

**2.5 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 06 | 04 |
| ද්විතියික | 40 | 35 |
| ප්‍රාථමික | 137 | 128 |

**2.6 වත්කම් කළමනාකරණය**

**2.6.1 ලැබිය යුතු ගිණුම්**

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම්වල වටිනාකම රු. 37,062,536 ක් වූ අතර කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

**2.6.2 අය වීමට ඇති සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට අය විය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම්වල එකතුව රු.16,397,211 ක් වූ අතර, කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා හිඟ හිටි ණය පිළිබඳ විශ්ලේෂණයන් කල නොහැකි විය.

**2.6.3 සමීක්ෂණය නොකළ වත්කම්**

සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම් වටිනාකම රු. 20,637,262 ක් විය.

2.7 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

**පොදු පහසුකම් ඉඩම්**

-----------------------

සභාවේ පොදු පහසුකම් ඉඩම් 03 ක් භාවිතයට ගෙන නොතිබුණු අතර ඉඩම වටා වැටවල් ගසා සභාව සතු බවට නාම පුවරු සවිකර නොතිබුණි. තවත් එක් ඉඩමකට අදාල මානක සැලැස්ම ලිපිගොනුවට ඇතුළත් කර නොතිබුණු අතර පිටුපස ඉඩම් හිමියා පොදු පහසුකම් සඳහා වෙන් කර ඇති ඉඩම මතින් මාර්ගයක් සකස් කර ගෙන තිබුණි.

2.8 **අවිධිමත් ගනුදෙනු**

--------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙ 8.9.1 (අ) වගන්තියේ විධිවිධාන අනුව කසල කළමනාකරණ සේවා සැපයුම්කාර ආයතනය සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොමැතිව 2010 මැයි සිට දෙසැම්බර් දක්වා එකී සේවාව සඳහා රු. 2,978,136 ක් ගෙවා තිබූ අතර 5,4,8 (අ) වගන්තියේ විධිවිධාන අනුව කොන්ත්‍රාත් වටිනාකමින් 5% කාර්ය සාධන සුරක්ෂිතයක් ද ඉදිරිපත් කර නොතිබුණි.

2.9 **කාර්ය සාධනය**

------------------

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය අනුව සහ බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2003 දෙසැම්බර් 17 දිනැති අංක LGD/07/03/02 (II) දරන චක්‍රලේඛයේ විධිවිධාන අනුව සභාව සතු මාර්ග වල ස්ථිර සලකුණු සහ සීමා ලකුණු කිරීම සහ ඒවායේ සැලැසුම් පිළියෙල කිරීම සිදු කල යුතුය. එසේ වුව ද,සභාව විසින් ඊට අනුකූල ව කටයුතු කර නොතිබුණු අතර 2010 වර්ෂයේ අයවැය ලේඛණයේ එම කටයුතු සඳහා ප්‍රතිපාදන කර තිබූණු රු. 100,000 ක ප්‍රතිපාදනයෙන් කිසිදු වියදමක් දරා නොතිබුණ බව ද දක්නට ලැබුණි.

2.10 **අභ්‍යන්තර විගණනය**

----------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** ආදායම් පර්පාලනය

**(ඇ)** තොග පාලනය